ජනාධිපතිතුමා විසින් හෝ එහෙම නැත්නම් රජය විසින් subcommittee එකක් හෝ පත් කරලා, මේ රටින් යන්න ඔවුන්ට තිබෙන හේතුව මොකක්ද කියලා සාකච්ඡා කරන්න යම් වැඩ පිළිවෙළක් හදා ගන්න ඕනෑ. මොකද, දැන් මේ රටින් පිට රටට ගලාගෙන යන පිරිස ඉතා වැඩියි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රදේශයේ කලාප කිහිපයක ළමා මන්දපෝෂණය පිළිබඳව කරන ලද සමීක්ෂණයක තොරතුරු මාධ්‍යයට හෙළි කිරීම නිසා වෛද්‍ය චමල් සංජීව මහතාගේ වැඩ තහනම් කරලා තිබෙනවා. සත්‍ය හෙළි කිරීම උඩ වෛද්‍යවරයෙකුගේ වැඩ තහනම් කරනවා නම්, ඒක සාධාරණ නැහැ. දැන් ඇතැම් වෛද්‍යවරු රට හැර යමින් සිටිනවා. වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින මෙවැනි අවස්ථාවක කිසිදු විනය විරෝධී ක්‍රියාවක් නොකළ, රටේ ජනතාවට සත්‍ය හෙළි කළ මේ වෛද්‍යවරයා එම චෝදනාවෙන් නිදහස් කරන්න කියලා මම ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා.

පොළොන්නරුව මහ රෝහලේත්, චීන-ශ්‍රී ලංකා මිත්‍රත්ව ජාතික වෘක්කවේද විශේෂිත රෝහලේත් දැන් යම් යම් අර්බුද ඇතිවෙලා තිබෙනවා. මේ විධියට අද හැම තැනම අර්බුද තිබෙනවා. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පාසල්, රෝහල් ආදී හැම තැනකම ප්‍රශ්න මතුව තිබෙනවා. මෙහිදී සමහරු කණ්ඩායම් වශයෙන් බෙදිලා සිටිනවා. එසේ බෙදීමෙන් ඇති වූ ගැටුම් නිසා පොළොන්නරුව රෝහලේ සිටි සැහෙන්න වෛද්‍යවරු පිරිසක් දැන් පිට රට ගිහිල්ලා තිබෙනවා. දුෂ්කර ප්‍රදේශයක් වන මැදිරිගිරියේ තිබුණු රෝහල මම ඉතාම ලස්සනට හැදුවා. එහි VOGsලා දෙදෙනෙක් සිටියා. ඒ VOGsලා දෙදෙනාම කියන්නේ නැතුව එකම දවසේ යන්න ගිහිල්ලා. එතකොට, මැදිරිගිරිය වාගේ ඈත ගම්මානවල සිටින ඉතාම දුගී දුප්පත් ජනතාව බෙහෙත් ගැනීමට පොළොන්නරුව රෝහලට එන්න ඕනෑ. ඒ අයට වාහනයක් අරන් එන්න පුළුවන්කමක් නැහැ. ඔවුන්ට එවැනි ආර්ථික ශක්තියක් නැහැ. බබෙක් හම්බවෙන්න ඉන්න අම්මා කෙනෙකුට අමාරු වුණාම බස් එකේ එන්න පුළුවන්කමකුත් නැහැ.

වෛද්‍යවරුන් පිට රට යෑම සහ උගතුන් පිට රට යෑම පිළිබඳව කථා කළොත්, මේ වන විට විශ්වවිද්‍යාල මහාචාර්යවරු, ආචාර්යවරු 3,000කට වැඩි පිරිසක් මේ රටේ නැහැයි කියනවා. රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඒකකයට අයත් අනුරාධපුර රෝහලේ තිබුණු ළමා වාට්ටුව සම්පූර්ණයෙන්ම වහලා දැම්මා, ආචාර්යවරු, මහාචාර්යවරු නැති නිසා. ඒ නිසා එම විශ්වවිද්‍යාලයේ MBBS කරන ළමයින්ට දැන් ළමා රෝග පිළිබඳව අධ්‍යාපනය දෙන්න කෙනෙක් නැහැ. මූලික වශයෙන්ම මේ ප්‍රශ්නවලට කෙටි කාලීන ක්ෂණික විසඳුම් අවශ්‍යයි වාගේම, මුළු රටේම තිබෙන ප්‍රශ්නවලට මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන විසඳුම් අවශ්‍යයි. මම විශ්වාස කරන විධියට එහෙම වුණොත් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයත් මේ තත්ත්වයෙන් ගොඩ ගන්න පුළුවන් වෙන්නේ කියන කාරණයත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ගයාෂාන් නවනන්ද මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. WEERASUMANA WEERASINGHE left the Chair, and THE HON. (DR.) (MS.) HARINI AMARASURIYA took the Chair.*

[අ.භා. 2.07]

**ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கயாஷான் நவனந்த)
(The Hon. (Dr.) Gayashan Nawananda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බොහොම ස්තුතියි.

මා කථාව ආරම්භ කරන්නේම මේ විශ්වාස භංග යෝජනාව ගෙනා මන්ත්‍රීතුමා පිළිබඳව විශ්වාසය නැහැ කියා ප්‍රකාශ කරමින්. එහෙම කියන්න හේතුව මම ක්‍රමානුකූලව කියන්නම්. මම මූලිකවම මේ විශ්වාස භංග යෝජනාව දෙස බලන්නේ අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය විනාශ කරන්න ගෙනාපු යෝජනාවක් විධියටයි. ඒ, එක. දෙක, මෙය පෞද්ගලික අංශය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක්. ඒ වාගේම මෙය අපේ රටේ අහිංසක ලෙඩුන් මතින්, මිනිසුන්ගේ මිනී මතින් කරන ජරා දේශපාලනයක් බවත් මම සඳහන් කරන්න ඕනෑ.

මේ රටේ සෞඛ්‍ය විනාශ කළ ආකාරය කියනවා නම්, කලින් කථා කළ මන්ත්‍රීවරයෙකු සඳහන් කළා වාගේ මීන් පෙර රුබෙල්ලා එන්නත ලබා දීමෙන් පසුව රෝගීන් දෙදෙනෙකු මිය යෑමත් සමඟ රුබෙල්ලා එන්නත ලබා ගැනීම ශීඝ්‍රයෙන් පහළ ගිහින් අපේ රටේ කිසිම කෙනෙක් ඒ එන්නත ලබා නොගන්නා තැනට පත් වුණා. ඒ වාගේම මේ යන කතිකාව නිසා මා නියෝජනය කරන මොණරාගල දිස්ත්‍රික්කයේ සිටින පෞද්ගලික රෝහල්වලට යා නොහැකි මිනිසුන්ගේ ඛේදවාචකය තමයි, ඔවුන් high blood pressureවලට ගන්න බෙහෙත් පෙත්ත, heart attack එකට ගන්න ඇස්ප්‍රින් පෙත්ත නොගන්නා තත්ත්වයට පත් වෙන එක. අන්තිමට ඒ කියන කථාවට එහා ගිහිල්ලා මේ රටේ වෙනත් ලෙඩ රෝගවලින් මිය යන සංඛ්‍යාව වැඩි වීම. මේක එවැනි යෝජනාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මෙතැන මගේ නම ආමන්ත්‍රණය කෙරෙන්නේ, "ගරු ගයාෂාන් නවනන්ද" කියලා. මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා, ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා. හැබැයි, "වෛද්‍ය" යන්නෙහි definition එකේ සඳහන් වෙන්නේ, "A person who is qualified to treat people who are ill." Other than that,